# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022
2024 දෙසැම්බර්/ 2025 ජනවාරි

සමාජීය විද්‍යා පීඨය

සමාජවිද්‍යාව
(නව නිර්දේශය)

**සංස්කෘතිය සහ සංවර්ධනය - SOCI 28224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. අවම වශයෙන් නිර්වචන තුනක් (03) ඇසුරෙන් සංස්කෘතිය යනු කුමක්දැයි පැහැදිලි කර සංස්කෘතියේ ප්‍රධාන සංරචක මොනවාදැයි හඳුන්වන්න.

02. 'ආර්ථිකමය මිනුම් මගින් පමණක් සංවර්ධනය මැනිය නොහැකිය.' මෙම ප්‍රකාශය සම්බන්ධයෙන් ඔබේ අදහස් විවේචනාත්මකව ඉදිරිපත් කරන්න.

03. සංස්කෘතික භාවිතයන් සංවර්ධනයට බාධාවක් වන්නේ කෙසේදැයි උදාහරණ ඇසුරෙන් විමසන්න.

04. ඌන සංවර්ධනය යනු කුමක්දැයි නිර්වචන ආශ්‍රයෙන් පැහැදිලි කර ඌන සංවර්ධනය පිළිබඳ නව-මාක්ස්වාදීන්ගේ අදහස් විශ්ලේෂණය කරන්න.

05. ප්‍රොතෙස්තන්ත්‍ර ආගමික ආචාර ධර්ම සහ යුරෝපයේ ධනවාදයේ සංවර්ධනය පිළිබඳ මැක්ස් වෙබර්ගේ මතය විශ්ලේෂණය කරන්න.

06. සමාජය විසින් ස්ත්‍රී-පුරුෂ භූමිකා හැඩගස්වන ආකාරය ස්ත්‍රී-පුරුෂ සමාජ සමානාත්මතාව කෙරෙහි බලපාන්නේ කෙසේදැයි නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

07. ගෝලීයකරණය සමාජයට සහ සංස්කෘතියට කරන සාධනීය සහ නිශේධනීය බලපෑම් පිළිබඳ සමාජවිද්‍යාත්මක රචනයක් ලියන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට (02) සටහන් ලියන්න.

    අ. සංස්කෘතික සාපේක්ෂතාවාදය (cultural relativism)
    ආ. ප්‍රජා සංවර්ධනය
    ඇ. සංවර්ධන සැලසුම්
    ඈ. ඊ.බී. ටයිලර් (E.B. Tylor)

******************************